ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගම - 2024/2025

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ, හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට (SLFRS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට (SLFRS for SMEs) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, **පාලනය කරන** පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**:**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත ;

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර

තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (SLFRS for SMEs).

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පූර්ව වර්ෂ ගැලපීම් ලෙස රු.21,226,486ක අඩු කිරීම් සහ රු.4,046,614ක එකතු කිරීම් ලෙස රු.17,179,872ක් සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණද, සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි (SLFRS for SMEs) 10.21 වගන්තිය ප්‍රකාරව, සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබුණි. තවද, එම ප්‍රමිතියේ 10.23 වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතු හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 10.21 සහ 10.23 යන ඡේද යටතේ සඳහන් පෙර කාලපරිච්ඡේදවල දෝෂ පිළිබඳ නිරීක්ෂණය පිළිගනු ලබයි. රු.17,179,872ක ගැලපීම් වත්මන් කාලපරිච්ඡේදය තුළ සටහන් කරන ලදී.	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පෙර කාලපරිච්ඡේදවල දෝෂ සම්බන්ධ ගැලපීම්වල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත ප්‍රකාශ කළ යුතු අතර, එම දෝෂවලට අදාළව අවශ්‍ය හෙළිදරව් කිරීම් ද කළ යුතුය.
(ආ)	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ **17.19** වගන්තියට අනුකූලව**, 2025** මාර්තු **31** වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පවතින රු.**1,021,841,413** ක වටිනාකමකින් යුත් වත්කම්වල ඵලදායී ආයුකාලය සහ අවශේෂ අගය සමාලෝචනය කිරීමටත්, ඒ අනුව වාර්තා කිරීමටත් පියවර ගෙන නොතිබුණි.	සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම්වල ඵලදායී ආයුකාලය නැවත තක්සේරු කිරීම සිදුකරන්නේ නම්**,** එම වත්කම්වල මුලින් අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ සිදු කලයුතු අතර**,** පූර්ණ ලෙස ක්ෂය කරන ලද වත්කම් **ERP** පද්ධතිය තුළ නැවත තක්සේරු කළ නොහැකි බව කළමනාකාරීත්වය පෙන්වා දීමට කැමැත්තේය. වාර්තා කිරීමේ අරමුණු සඳහා පමණක් සම්පූර්ණයෙන්ම	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව**,** සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම්වල ඵලදායී ආයුකාලය සහ අවශේෂ අගය සමාලෝචනය කිරීමට හා වාර්තා කිරීමට පියවර ගත යුතුය.

		ක්ෂය වී ඇති වත්කම් නැවත තක්සේරු කිරීම මගින් අනවශ්‍ය මූල්‍ය බරක් ඇති විය හැකිය.	
(ඇ)	රු.**3,441,163,367**ක පිරිවැයක් සහිත ගොඩනැගිල්ලක් **3.33%**ක අනුපාතයකට ක්ෂය කරනු ලබන අතර, ආදායම් බදු සඳහා **5%**ක අනුපාතයකට ප්‍රාග්ධන දීමනා ඉල්ලා ඇත. කෙසේ වෙතත්, විලම්භිත බදු ගණනය කිරීමේදී බදු අය කළ හැකි තාවකාලික වෙනස සැලකිල්ලට නොගැනීම හේතුවෙන්, විලම්භිත බදු වගකීම රු.**8,635,114**කින් අවතක්සේරු වී තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි **29** වන වගන්තියට අනුකූලව නොතිබුණි.	**1B** ගොඩනැගිල්ලට අදාළ විලම්භිත බදු වගකීම පිළිබඳ නිරීක්ෂණය සමාගම විසින් පිළිගනු ලැබේ. එම විලම්භිත බදු වගකීම ගැලපීම හා ඊට අදාළ විලම්භිත බදු වියදම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ඇත.	විලම්භිත බදු වගකීම හෝ වත්කම, ප්‍රාග්ධන දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කළ යුතු අතර, සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ **29** වන වගන්තියට අනුකූලව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ **(SLFRS for SMEs) 27.2** වැනි වගන්තිය ප්‍රකාරව, සෑම වාර්තාකරණ දිනයකදීම තොගවල අගය හීන වී ඇත්දැයි ආයතනයක් විසින් තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, **2022** වසරේදී අත්හැර දමන ලද නැනෝ පොහොර ව්‍යාපෘතියට අදාළව මූල්‍ය ප්‍රකාශනවල නොනිමි තොග ලෙස රු.**2,310,960** ක සහ නිමි භාණ්ඩ ලෙස රු.**1,412,601** ක වටිනාකමින් යුතුව සටහන්ව තිබූ භාවිතයට නොගන්නා තොග සම්බන්ධයෙන් මෙන්ම, **2018** වසරේ සිට චලනය නොවී පවතින රු.**2,726,697** ක වටිනාකමකින් යුත් සාමාන්‍ය රසායනික ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන්ද ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.	සමාගම මෙම නිරීක්ෂණය සමඟ එකඟ වේ. සෑම වාර්තාකරණ දිනයේදී සියලුම තොගවල ගිණුම්ගත වටිනාකම කළමනාකාරීත්වය විසින් ඇගයීමට ලක් කර, සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ **(SLFRS for SMEs)** 27.2 වැනි වගන්තිය ප්‍රකාරව, නැනෝ පොහොර ව්‍යාපෘතිය සහ සාමාන්‍ය රසායනික ද්‍රව්‍ය එකතුව ඇතුළුව සෙමින් චලනය වන හෝ භාවිතයට නොගැනෙන අයිතම සඳහා සුදුසු වෙන් කිරීම් සිදු කරනු ඇත.	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, තොගවල අගය අඩුවීම් පිළිබඳව තක්සේරු කිරීම් සිදු කළ යුතු අතර ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතුය.
(ඉ)	සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ **33.7** සහ **33.9** වගන්ති ප්‍රකාරව, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමිකය අනාවරණය කළ යුතු	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමිකය අනාවරණය කිරීම සම්බන්ධයෙන්, හිටපු ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ	වාර්තාකරණ කාල සීමාව තුළ හෝ ඉන් පසුව සිදු වූ ඕනෑම ඉල්ලා අස්වීමක් හෝ තනතුරේ වෙනසක්

වුවද, අධ්‍යක්ෂවරුන්ට ගෙවා ඇති රු.**13,636,041**ක වැටුප් හා දීමනා, සමාගමේ කොටස්හිමියන් විසින් වාර්ෂික සියයට **5**ක සහනදායී පොලී අනුපාතිකයක් යටතේ සමාගමට ලබා දී ඇති ණය, සහ එම ගනුදෙනුවට අදාළ විස්තර සහ කොන්දේසි සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මණ්ඩලයෙන් ඉල්ලා අස්වීමේ ලිපියක් ඉදිරිපත් කර ඇති අතර, ඒ බව සමාගම් ලේකම්වරයාගෙන් තහවුරු කරගත හැකිය. ඒ අනුව, ඔහුට ගෙවන ලද වැටුප් හා දීමනා මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම අවශ්‍ය නොවේ. සම්බන්ධිත පාර්ශව ණය සම්බන්ධයෙන් **MAS Capital (Pvt) Ltd.,** වෙතින් ලබාගත් ණය සහ එයට අදාළ සියලුම කොන්දේසි හා නියමයන් සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ **33.9** වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස අනාවරණය කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	නොසලකා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමිකය, සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන මගින් ලැබුණු රු.226,058,502ක ප්‍රාග්ධන අරමුදල් වෙනුවෙන් කොටස් නිකුත් කිරීමට සමාගම පියවර ගෙන නොතිබුණි. ඒ වෙනුවට, මෙම මුදල සම්බන්ධිත පාර්ශවයකින් ලැබුණු අත්තිකාරමක් ලෙස සටහන් කර තිබුණි.	SLINTEC හි අධ්‍යක්ෂ මණ්ඩලය, මෙම ප්‍රාග්ධන අරමුදල් සඳහා කොටස් නිකුත් කිරීමටත්, සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (SLFRS for SMEs) 33.8 වගන්තියට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව නිසි ලෙස හෙළිදරව් කිරීම තහවුරු කිරීමටත් අවශ්‍ය පියවර ගනු ඇත.	ප්‍රාග්ධන අරමුදල් සඳහා කොටස් නිකුත් කිරීමට සමාගම විසින් අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	2012 සිට 2024 දක්වා කාලසීමාව තුළ ප්‍රාග්ධන දායකත්ව ලෙස ලැබුණු රු.2,079,917,175ක ප්‍රදාන වෙනුවෙන් රජයට කොටස් නිකුත් කිරීමට සමාගම පියවර ගෙන නොතිබුණි.	අදාළ අනුමැතීන් සහ අවශ්‍යතාවලට අනුකූලව කොටස් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.	අදාළ අනුමැතීන් සහ අවශ්‍යතාවලට අනුකූලව කොටස් නිකුත් කිරීමට සමාගම විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනයන්හි සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ 2.6 සටහන වෙත අවධානය යොමු කරමි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාගම රු.1,403,743,526 ක සමුච්චිත අලාභයක් ලබා ඇති අතර, එදිනට, සමාගමේ මුළු වත්කම් වටිනාකම ඉක්මවූ මුළු වගකීම් වටිනාකම රු.41,234,049ක් විය .	මෙය විශේෂ මහා සභා රැස්වීමේදී (EGM) සාකච්ඡාවට ලක් කර ඇත.	සමාගමේ අඛණ්ඩ පැවැත්මේ තත්ත්වය පිළිබඳව ප්‍රවේශමෙන් තක්සේරු කර, ඒ සඳහා නිසි අවධානය යොමු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් හඳුන්වාදෙන දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය.	2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, මාස 03කුත් දින 29 ක ප්‍රමාදයකින් පසුව 2025 සැප්තැම්බර් 29 දින ඉදිරිපත් කර තිබුණද, ඒ සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි. විගණන දිනය වන විටත්, 2022 සහ 2023 වර්ෂ සඳහා වන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	අදාළ කාලසීමාව තුළ කළමනාකාරීත්වයේ සිදු වූ වෙනස හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී සිදු වූ මෙම ප්‍රමාදය සමාගම විසින් පිළිගනිමි.	රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි සඳහන් නියමිත දිනයන්ට පෙර, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සහ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපතිවරයා වෙත භාර දිය යුතු අතර, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයෙහි 11 වන වගන්තිය.	2024 සහ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂ සඳහා ස්ථාවර වත්කම්වල වාර්ෂික භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි.	කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන්, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්ථාවර වත්කම්වල වාර්ෂික භෞතික පරීක්ෂාව සිදු නොකෙරිණි. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා භෞතික පරීක්ෂාව සිදු කරන ලදී.	චක්‍රලේඛයට අනුකූලව ස්ථාවර වත්කම්වල වාර්ෂික භෞතික සත්‍යාපනය සිදු කළ යුතුය.

1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම විසින් 2023 අගෝස්තු මාසයේ සිට ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද රු.32,703,895 ක් සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද රු.12,793,815 ක් මෙතෙක් ප්‍රේෂණය කර නොමැත.	ව්‍යුහගත ගෙවීම් සැලැස්මක් ලබා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එම දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් SLIBTEC ආශ්‍රිත එකතු කළ අගය මත බදු ගෙවීම පහසු කරවීම සඳහා අමාත්‍යාංශයේ මැදිහත්වීම ද අපේක්ෂා කෙරේ.	අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු මුදල් කඩිනමින් ප්‍රේෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය වහාම අවශ්‍ය පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.140,834ක ලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.10,253,101 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලහි රු.10,112,267ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු.76,631,726කින් වැඩි වීම සහ පරිපාලන වියදම් රු.4,620,953කින් අඩුවීමට එරෙහිව වෙළඳ ලැබීම් රු.64,578,381කින් අඩුවීම සහ පර්යේෂණ හා සංවර්ධන පිරිවැය රු.30,484,778කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
නැනෝ පොහොර සංවර්ධන තාක්ෂණය පැවරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගම විසින් 2012 මාර්තු 15 වැනි දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළැඹ ඇත. ගිවිසුමට අනුව සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 2,250,000ක් වූ අතර වාරික හතරකින් ආපසු අය කර ගැනීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ගිවිසුමට අනුව ඇමෙරිකානු ඩොලර් 1,000,000ක මුදලක් පමණක් නියමිත වේලාවට නිරවුල් කර ඇත. තවද, 2013 ජූනි 30 වන දින ඉන්වොයිසිය යවා ඇතත්, තවමත් ඇමෙරිකානු ඩොලර් 750,000ක මුදලක් ලැබී නොමැත.	පෝෂක ද්‍රව්‍ය සෙමින් නිදහස් කරන පොහොර සඳහා නාගර්ජුන ආයතනය මිලදී ගෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 1.0ක් පේටන්ට් බලපත්‍රය මාරු කිරීම සඳහා ගෙවා ඇත.SLINTEC ආයතනය විසින් පේටන්ට් බලපත්‍රය පවරා දීමත් සමඟම, ඔවුන් විසින් දෙවන වාරිකය ගෙවීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මූල්‍යමය අභියෝග හේතුවෙන් ගෙවිය යුතු මුදල් පියවීමට සේවාදායකයාට නොහැකි විය. තවද අපගේ නමින් ඇති පේටන්ට් බලපත්‍රය නිකුත් කර නොමැති අතර, ඉතිරි මුදල නොලැබුණහොත් අපගේ පේටන්ට් බලපත්‍රයට ඉදිරියේදී මුදල් ඉපැයීමට කටයුතු කරන බවට සඳහන් කරමින් ලිපියක්ද සේවාදායකයා වෙත නිකුත් කර ඇත.	ගිවිසුම් ප්‍රකාරව, ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 සැප්තැම්බර් මාසයේ සිට සභාපතිවරයා විසින් සමාගමේ විධායක කටයුතු මෙහෙයවමින් සිටී.	**2025** අගෝස්තු මාසයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මණ්ඩල පත්‍රිකාවට අනුව, ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කරන තෙක් අන්තර්කාලීන පදනමක් මත සමාගමේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා සභාපතිවරයා ඉල්ලීමක් කර තිබුණි. මෙම විධිවිධානය නායකත්ව සංක්‍රාන්ති කාලසීමාව තුළ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තාවකාලික පියවරක් ලෙස යොදා ගැනුණි. පාලන කාර්යයන් සහ විධායක කාර්යයන් අතර පැහැදිලි වෙන්වීමක් පවත්වාගෙන යාමේ වැදගත්කම සමාගම පිළිගන්නා අතර, ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කිරීමෙන් අනතුරුව මෙම විධිවිධානය විධිමත්ව නියාමනය කරනු ඇත.	ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**2017** වසරේදී රු.**32,372,109**ක රජයේ ප්‍රදානයක්ද ඇතුළුව රු.**65,873,148**ක වියදමක් දරා හරිතාගාරයක් ස්ථාපනය කර තිබුණද, එය එහි පූර්ණ ධාරිතාවෙන් භාවිතයට නොගැනීම හේතුවෙන් අක්‍රියව පවතී. මේ නිසා, වාර්තාකරණ දිනය වන විට එම හරිතාගාරය මගින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමාගම සමත් වී නොතිබුණි.	මෙම පහසුකම අභ්‍යන්තර සහ සහයෝගී කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා භාවිත කර ඇති අතර, **Codgen** සහ **LOLC** උසස් තාක්ෂණයන් වැනි ආයතන සමඟ සිදු කෙරෙන සහයෝගී කටයුතු සඳහා ද හරිතාගාර පහසුකම ලබා දී ඇත. මීට අමතරව, මෙම හරිතාගාර පහසුකම දිගුකාලීන පදනමක් මත කුලියට දීම සඳහා කළමනාකාරීත්වය මේ වන විට ලංකෙම් (පුද්ගලික) සමාගම සමඟ සාකච්ඡා පවත්වමින් සිටී.	වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා පූර්ණ ලෙස භාවිත කළ යුතුය.

(ආ)	**2017** වසරේදී ආරම්භ කරන ලද සක්‍රීය ඖෂධීය අමුද්‍රව්‍ය **(API)** නියමු බලාගාර උපාය මාර්ගික ව්‍යාපෘතියේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනය දියුණු කිරීමට සහ එම අමුද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීමට සහාය වීමයි. රජයේ ප්‍රදාන මගින් මෙම නියමු බලාගාරය ස්ථාපිත කිරීම සඳහා රු.**89,946,023**ක මුදලක් වැය කර තිබුණි. පර්යේෂණාගාර මට්ටමේදී සාර්ථක පර්යේෂණ සිදු කර තිබුණද, මෙම ව්‍යාපෘතිය පසුව අත්හැර දමා ඇති අතර, ඉන් අපේක්ෂිත කිසිදු ආර්ථික හෝ සමාජීය ප්‍රතිලාභයක් අත්කරගෙන නොමැත.	ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගම විසින් රසායනාගාර පරිමාණ පරීක්ෂාව සම්පූර්ණ කර, අවශ්‍ය කිලෝ පරිමාණයන් ලබා ගෙන, විශ්ලේෂණ සහතිකය ලබා ගෙන ඇත. අපගේ **BD** කණ්ඩායම මෙම නිෂ්පාදනය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සමාගම වෙත ඉදිරිපත් කරන ලද අතර, ඔවුන් විසින් හම්බන්තොට **API** නියමු ව්‍යාපෘතියක් සඳහා තනි තනිව හෝ සාමූහිකව ආයෝජනය කරන ලෙස ඉල්ලා සිටින ලදී. මේ සඳහා රජයෙන් මුදල් ලබා නොදී පෞද්ගලික අංශයෙන් මුදල් යෙදවිය යුතු බව ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයින් විශ්වාස කළ නිසා ඔවුන්ගේ මතයට අනුව මෙම ව්‍යාපෘතිය අත්හැර දමන ලදී. මෙම උපකරණවලින් සමහරක් වෙනත් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඛනිජ රසායනාගාර සහ ස්වාභාවික නිෂ්පාදන රසායනාගාර විසින් භාවිතා කරනු ලැබේ.	වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා පූර්ණ ලෙස භාවිත කළ යුතුය.
(ඇ)	රු.24,072,287ක පිරිවැයකින් නැනෝ පොහොර නිෂ්පාදනය සඳහා කම්හලක් ස්ථාපිත කර තිබුණද, එහි මෙහෙයුම් නතර කර 2022 වර්ෂයේදී ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සම්පත් ඵලදායී ලෙස භාවිත නොකර මෙම ව්‍යාපෘතියට අදාළ සමස්ත ආයෝජනයම අක්‍රියව පවතී.	2009 වසරේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය, පර්යේෂණාගාර මට්ටමේ සිට නියමු ව්‍යාපෘති මට්ටම දක්වා දියුණු කර ඇති අතර, 2012 වර්ෂයේදී ඉන්දියානු පොහොර සමාගමක් සමඟ තාක්ෂණික සහයෝගිතාවක් ද ඇතුළුව දේශීය හා ජාත්‍යන්තර පිළිගැනීම් ලබාගෙන තිබුණි. 2017 වර්ෂයේදී ස්ථාපිත කරන ලද කුඩා පරිමාණ නිෂ්පාදන කර්මාන්තශාලාව මගින් නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහාය ලබාදී තිබුණි. කෙසේ වෙතත්, වාණිජකරණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය සහ මූල්‍යමය සහායක් නොලැබීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු අත්හිටුවන ලදී. 2022 වසරේදී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නතර කිරීමට සිදුවූයේ කළමනාකාරීත්වයේ පාලනයෙන් ඔබ්බට වූ බාහිර සාධක හේතුවෙනි.	වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා ඵලදායී ලෙස භාවිත කළ යුතුය.

(ඇ)	සමාගම විසින් **2021** වසරේදී**,** කාමර **62**කින් සමන්විත නේවාසිකාගාර ගොඩනැගිලි දෙකක් ඉදිකර තිබූ අතර**,** සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉන් කාමර **30**ක් භාවිතයට නොගෙන පැවතුණි.	වසර අවසානයේදී භාවිතයෙන් තොරව පවතින බව හඳුනාගත් කාමර **30** අතුරින් **4**ක් කුලී ගිවිසුම යටතේ **SLIBTEC** ආයතනයට අයත් වේ. ඉතිරි කාමර **26** සේවක ඉල්ලීම් සහ මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව ඔවුන් වෙත වෙන් කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදුවෙමින් පවතින බැවින්**,** ඒවා ස්ථිරවම භාවිතයෙන් තොර කාමර ලෙස නොසැලකේ.	වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා ඵලදායී ලෙස භාවිත කළ යුතුය**.**

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **සංයුක්ත සැලැස්ම**

විගණන නිරීක්ෂණ	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාගම විසින් උපායමාර්ගික සැලැස්මක් සකස් කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය පිළිගනු නොලැබේ. අදාළ අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සෑම වසරකම නිසි පරිදි සකස් කර අදාළ විෂයභාර අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ. තවද**,** සමාගමේ කළමනාකාරිත්වය උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් සිටින අතර**,** එය **2026** ජනවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය හා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.	සමාගම උපායමාර්ගික සැලැස්මක් සකස් කරගත යුතුය.

4.7 **විගණන කමිටුව**

විගණන නිරීක්ෂණ	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ආයතනික පාලනයේ මාර්ගෝපදේශවලට අනුව සමාගම විසින් විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.	අදාළ මාර්ගෝපදේශවලට අනුකූලව **2025** අගෝස්තු මාසයේදී විගණන කමිටුව පිහිටුවන ලදී. එහෙත්**,** පත් කරන ලද විගණන කමිටු සභාපතිවරයා **2025** දෙසැම්බර් මාසය අවසන් වීමට පෙර ඉල්ලා අස්වීම හේතුවෙන් එම කමිටුව අක්‍රීය තත්ත්වයට පත්විය.	සමාගම ආයතනික පාලන මාර්ගෝපදේශයන්ට අනුව විගණන කමිටුවක් ස්ථාපිත කළ යුතුය.